*සැ. යු.* — 2015.04.02 දින පළ වූ අංක 1,909 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,910 - 2015 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2015.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 674 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

673- B 80937— 5,302 (2015/04)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015 වර්ෂය

01. බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2015.04.24 වේ.

03. *පොදු කොන්දේසි.-*

03.1 අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

03.2 2015.04.24 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

03.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

03.4 මනා චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

03.5 ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව තිබිය යුතු ය.

04. 4.1 *අධ්‍යාපන සුදුසුකම්.-* සිංහල/දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව සහ ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව එකවර අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් විෂයයන් 06 ක් සමත්වීම.

*සහ*

අ.පො.ස. (උ. පෙළ විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයක් හෝ සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

4.2 *වෘත්තීය සුදුසුකම්.-* තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක අලෙවිකරණය පිළිබඳ අවම වශයෙන් හය (06) මසකට නොඅඩු (අර්ධ කාලීන) පුහුණු පාඨමාලාව හදාරා සාර්ථකව නිමකළ බවට සහතිකයක් ලබා තිබීම.

4.3 *පළපුරුද්ද.-* රජයේ ලියාපදිංචි ආයතනයක වෙළඳ කළමනාකරු වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්ද තිබිය යුතු ය.

(සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් 2015.04.24 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.)

05. *සේවා කොන්දේසි.-* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

06. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා. ප. ච. 06/2006 (iv) අනුව රු. 13,120- 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - 22,040 (MN-1-2006A) වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.-* ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

*සටහන.-* බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය. මෙය පහත දැක්වෙන විෂයයන් 02 න් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත ය.

| *විෂය* | *කාලය (පැය)* | *ලකුණු* |
|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම | 01 | 100 |
| 2. බුද්ධි පරීක්ෂණය | 01 | 100 |

*සාමාන්‍ය දැනීම.-* ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, විද්‍යාත්මක, ආර්ථික වශයෙන් අදාළ කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

*බුද්ධි පරීක්ෂණය.-* අපේක්ෂකයාගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% කින් බැගින් ලබා ගත යුතුය. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටී නම් සුදුස්සකු/සුදුස්සන් තෝරා ගැනීමේ තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් සතු ය.

08. *විභාග ගාස්තු.-*

8.1 විභාග ගාස්තුව රු. 400 කි. මෙම විභාග ගාස්තු බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බප 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

8.2 අයදුම්කරුවන් තම අයදුම්පත මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත අනුව, ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 : 29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය. ඉල්ලුම් පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යයෙන්ම විය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.04.24 වැනි දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම හා කර්මාන්ත අමාත්‍යාංශය (බ.ප), තැ. පෙ. 566, ශ්‍රාවස්ථි මන්දිරය, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු, III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම 2015" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනමටත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු

අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර,
සංස්කෘතික සහ කලා කටයුතු
අමාත්‍යාංශය (බ.ප.)

ආදර්ශ අයදුම්පත

***බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2015***

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

1. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2015.04.24 දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය

අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

(iv) දුරකථන අංකය : පෞද්ගලික :........................................................

රාජකාරි :........................................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය.- (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය.- (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

05. (i) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) 2015.04.24 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

06. අධ්‍යාපන සුදුසුකම්.- (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 අනුව)

6.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

6.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.3 නිවේදනයේ 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය හා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් :

6.3.1 පුහුණු පාඨමාලාවේ නම :————.

පුහුණු කාල සීමාව :.................................. සිට .............................. දක්වා
ආයතනය :————.
සහතිකය වලංගු දිනය :————.

6.3.2 *පළපුරුද්ද පිළිබඳ විස්තර.-*

ආයතනයේ නම :————.

කාල සීමාව :.................................. සිට ...................................... දක්වා

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
දිනය :————.

| |
|---|
| මෙහි ලදුපත නොගැලවෙන සේ අලවන්න. |

08. ............................................................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළඳ කළමනාකරු III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසළකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය.................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

10. රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-

....................................................................................................... මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ.................................................................................. වශයෙන් ...................................................................... දින සිට සේවය කරන බවත්, තනතුර සථිර කර ඇති බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහ/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

04-267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.